පුවත්පත් විශේෂාංග ලිපි

සිංහල

10 ශ්‍රේණිය

II වාරය

නිපුණතාව - 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම - **8.2** පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි.

ඉගෙනුම් පල -

- පරිකල්පනීය නොවන විචාරාත්මක, විමර්ශනාත්මක හා ගවේෂණාත්මක මාතෘකාවලට අදාළ ව කරුණු සංවිධානය කර ගනිමින් ලියයි.
- භාෂාත්මක යෙදුම් උචිත පරිදි භාවිත කරයි.
- සම්මත ව්‍යාකරණානුකූල ව ලේඛනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම - 1

1. පුවත්පතක දක්නට ලැබෙන සුවිශේෂාංග හතරක් ලියන්න.

I. ..... III. .....

II. ..... IV. .....

2. පුවත්පත් විශේෂාංග ලිපි පිළිබඳ පහත සඳ හන් ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

I. විශේෂාංග ලිපියක් සමාජ වැදගත්කමකින් යුක්ත වෙතත් මූලාශ්‍රයක් පදනම් කොට ලිවිය යුතු ය. ☐

II. එහි ප්‍රධාන ලක්ෂණය විය යුත්තේ පාඨකයා කියවීමට ප්‍රිය කරන මාතෘකාවකි. ☐

III. මූලාශ්‍රයට අදාළ සැම පැතිකඩක් ම ආවරණය විය යුතු අතර නිර්මාණාත්මක වීම අවශ්‍ය නැත. ☐

LIVEWORKSHEETS

IV. අන්තර්ගතය සම්බර වීම අත්‍යවශ්‍ය වේ.

V. අපූර්වත්වයකින් යුක්ත ව ගෙන හැර පෑමේ කුසලතාවක් ප්‍රකට විය යුතුයි.

VI. තොරතුරු, කරුණු හා දත්ත ආදිය පදනම් කර ගනිමින් විශේෂාංග රචනා වෙයි.

VII. සමාජ සංවාදයකට තුඩුදෙන කරුණු විශේෂාංග ලිපියක ඇතුළත් නොවේ.

VIII. විශේෂාංග ලිපියකින් පාඨකයාට ගැඹුරු අවබෝධයක් ලැබිය යුතු ය.

IX. පාඨකයාගේ දැනුම අවදි කිරීමක් ඉන් සිදු නොවේ.

X. විශේෂාංග ලිපියකින් ගවේෂණාත්මක රචනයත් සේ සැලකිය නො හැකිය.

ක්‍රියාකාරකම -2

- විශේෂාංග ලිපි විවිධාකාර වේ. එබඳු ප්‍රභේදවලට නිදසුන් පහක් ලියන්න.
  1. .....
  2. .....
  3. .....
  4. .....
  5. .....

ක්‍රියාකාරකම -3

- පහත සඳහන් වන්නේ විශේෂාංග ලිපි කිහිපයක මාතෘකා ය. ඒවා කුමන ප්‍රභේදයකට අයත් දැයි සොයා ප්‍රභේදයේ අංකය ඉදිරියෙන් ඇති කොටුවෙහි යොදන්න.

1. පුද්ගල චරිත ආශ්‍රිත විශේෂාංග ලිපි	2. චාරිකා ආශ්‍රිත විශේෂාංග ලිපි
3. නිර්මාණ සාහිත්‍යය ආශ්‍රිත විශේෂාංග ලිපි	4. විද්‍යාත්මක තොරතුරු ආශ්‍රිත විශේෂාංග ලිපි
5. විචාර ආශ්‍රිත විශේෂාංග ලිපි	6. කුතුහලය දනවන විශේෂාංග ලිපි

LIVEWORKSHEETS

1. සිංහලයේ මහා ප්‍රාඥයා දැයෙන් සමුගනී.

2. බකමූණාගේ සැඟවුණු තොරතුරු

3. නිර්මාණකරණයේ දී සමාජ යථාර්ථය වැදගත්

4. ඩෙංගු මර්දනයට ජෛව ප්‍රහාරයක්

5. සුන්දර සීතාවක දැක ගනිමු

6. ගැමි දරුවන්ගේ ඇතුළාන්තය කියන රූප පෙළහර- හෝ ගානා පොකුණ

7. හේ සියවසේ ක්‍රීඩකයා වෙයි.

8. නිදිකුම්බා නිදන රහස

9. නවකතාවක දී චරිත නිරූපණය වැදගත්

10. සඟබෝ රජු හිස දන් දුන් අත්තනගල්ල කොහි ද ?

ක්‍රියාකාරකම -4

- **පහත සඳහන් පුවත්පත් වාර්තාව හොඳින් කියවා ඒ ඇසුරෙන් නිර්මාණාත්මක විශේෂාංග ලිපියක් සකස් කරන්න.**

ගිනිබත් නැව වෙරළ වනසයි.

පසුගියදා දික්ඕවිට ධීවර වරායට නුදුරින් මුහුදේ සිංගප්පූරු සමාගමකට අයත් භාණ්ඩ ප්‍රවාහනයේ යෙදුණු නැවක් හදිසි ගින්නක් හේතුවෙන් දැවී ගියේ ය. එහි බහාලුම් 1470 ක් පමණ තිබූ අතර ඇතැම් බහාලුම් රසායන ද්‍රව්‍ය අඩංගු ඒවා විය. එයින් සයුරු දිය දූෂණයට ලක් වී ඇති අතර මුහුදු ජීවීහු සිය ගණනක් මරුමුවට පත් වූහ.

ක්‍රියාකාරකම - 5

ජාතික පුවත්පතක පළ වූ ප්‍රවෘත්තියක් මූලාශ්‍ර කර ගෙන ඒ ඇසුරෙන් නිර්මාණාත්මක විශේෂාංග ලිපියක් සකස් කරන්න.

LIVEWORKSHEETS

පිළිතුරු

ක්‍රියාකාරකම -1

1)

I. වාර්තා
II. ශාස්ත්‍රීය ලිපි
III. සම්මුඛ සාකච්ඡා
IV. කතුවැකි
V. වාර්තා
VI. නිවේදන

2)

i. √
ii. ×
iii. ×
iv. √
v. √
vi. √
vii. ×
viii. √
ix. ×
x. ×

ක්‍රියාකාරකම -2

1 පුද්ගල චරිත ආශ්‍රිත
2 වාරිකා ආශ්‍රිත
3 නිර්මාණ ආශ්‍රිත
4 විද්‍යාත්මක තොරතුරු ආශ්‍රිත
5 විචාර ආශ්‍රිත
6 කුතුහලය දනවන

ක්‍රියාකාරකම - 3

1. 1
2. 4
3. 3
4. 4
5. 2
6. 5
7. 1
8. 6
9. 3
10. 2

- **ක්‍රියාකාරකම 4 හා 5 ප්‍රායෝගික ව යෙදෙන්න.**

LIVEWORKSHEETS

LIVEWORKSHEETS